LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය

# යාවත්කාලීන නව නීති සහ විධායක තීරණ
# 2026 ජනවාරි

5th February 2026

LAW
TRACKER

# නව නීති සහ විධායක තීරණ යාවත්කාල කිරීම - 2026 ජනවාරි

2026 පෙබරවාරි 5

## පටුන

Contents


**පටුන** ..... **1**

**I. සහතිකය සටහන් කරන ලද පනත්** ..... **2**

*1. 2026 අංක 1 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත* ..... *2*

**II. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති පනත් කෙටුම්පත්** ..... **3**

*1. කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත* ..... *3*

*2. ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත* ..... *3*

*3. නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ (සංශෝධන) පනත් කෙටුම්පත* ..... *3*

*4. පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත* ..... *4*

*5. පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් ඉවත් කිරීමේ පනත් කෙටුම්පත* ..... *4*

*6. යූඑන්වී පදනම සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත* ..... *4*

**III. තෝරාගත් අමාත්‍ය මණ්ඩල තීරණ** ..... **5**

*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග* ..... *5*

*මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන* ..... *5*

*සෞඛ්‍ය* ..... *6*

*ප්‍රවාහන මහාමාර්ග සහ නාගරික සංවර්ධන* ..... *7*

*අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන* ..... *8*

*කාන්තා හා ළමා කටයුතු* ..... *9*

*පරිසර* ..... *9*

*වරාය සහ ගුවන් සේවා* ..... *9*

*ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම්* ..... *9*

*ඩිජිටල් ආර්ථික* ..... *10*

*කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන* ..... *10*

*ධීවර, ජලජ සහ සාගර සම්පත්* ..... *10*

*වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම්* ..... *10*

*බලශක්ති* ..... *11*

*නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන* ..... *11*

*රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන* ..... *11*

*ජනාධිපති ලේකම් කාර්යාලය* ..... *12*

*මහජන ආරක්ෂක සහ ආරක්ෂක* ..... *12*

*පොලීසිය සහ සන්නද්ධ හමුදා සඳහා ප්‍රසම්පාදන සහ පහසුකම්* ..... *12*

*තරුණ කටයුතු සහ ක්‍රීඩා* ..... *12*

**IV. අති විශේෂ ගැසට් පත්‍ර (තෝරා ගත්)** ..... **13**

*ජාතික ආරක්ෂාව සහ මහජන සාමය* ..... *13*

*ලියාපදිංචි කිරීම සහ අනන්‍යතා* ..... *13*

*මැතිවරණ* ..... *13*

*කම්කරු සහ රැකියා* ..... *14*

*ප්‍රවාහන සහ රථ වාහන* ..... *14*

*සත්ව සෞඛ්‍යය* ..... *14*

*ක්‍රීඩා සහ තහනම් උත්තේජක විරෝධී* ..... *14*

*ආගම් ඇදහීම* ..... *14*

*පත්කිරීම්* ..... *15*

*ජාත්‍යන්තර සහයෝගීතාවය* ..... *15*

*ත්‍රස්තවිරෝධී සහ සම්බාධක* ..... *15*

*දූෂණ විරෝධී* ..... *15*

*සමිති ලියාපදිංචි කිරීම* ..... *15*

# I. සහතිකය සටහන් කරන ලද පනත්

## 1. 2026 අංක 1 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත

පනතෙහි අංකය: 2026 අංක 1
සහතිකය සටහන් කරන ලද දිනය: 2026 ජනවාරි 20
ප්‍රධාන නීතිය: 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත
ප්‍රධාන සංශෝධන:

- බලපත්‍රයක් සහ ලියාපදිංචි සහතිකයක් නිකුත් කර නොමැති නම් (ආපසු නොගෙවනු ලබන සැකසුම් ගාස්තු හැර) ගාස්තු අය කිරීම තහනම් කිරීම
- ආරම්භ වන දිනයට පෙරාතුව බලයලත් පුද්ගලයන්ගේ සේවකයන් සඳහා පමණක් ඔවුන්ගේ සේවා නියුක්ති ආදායමට වසර තුනක සංක්‍රාන්ති බදු නිදහස් කිරීමක් ලබා දීම සඳහා 35 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම; ආරම්භ කිරීමෙන් පසු බලයලත් පුද්ගලයන්ගේ සේවකයන් බදු ගෙවිය යුතුය.
- 2017 අංක 12 දරන විදේශ විනිමය පනතට අනුකූල වීම පිණිස වරාය නගරය තුළ විදේශ විනිමය පරිවර්තනයන් සිදු කළ යුතු බවට නියම කිරීම.
- වරාය නගරය තුළ අක්වෙරළ බැංකු මෙහෙයුම් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරීම.
- උපායමාර්ගික වැදගත්කමක් සහිත ව්‍යාපාරයක් ලෙස නම් කරනු ලැබීම සහ පවත්වාගෙන යාම සඳහා නියමිත නිර්ණායක සහ කලින් කලට කාර්ය සාධන ඇගයීම සිදුකිරීම හඳුන්වා දීම සහ ආනුෂංගික සංශෝධන සිදු කිරීම.

## II. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති පනත් කෙටුම්පත්

### 1. කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත

අංකය: 2026 අංක 7

තත්ත්වය: ඉදිරිපත් කළ දිනය (පළමුවෙනි වර කියවීම) - 2026 ජනවාරි 20

අරමුණ: කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීම, ඔවුන් නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා විධිවිධාන සැලසීම

ප්‍රධාන විධිවිධාන:

- කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීම සහ එම බලපත්‍ර අලුත් කිරීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම සඳහා නීති රාමුවක් ස්ථාපනය කිරීම
- කන්ටේනර් ඩිපෝ මෙහෙයුම් සඳහා අවශ්‍ය කරන අවම මෙහෙයුම්, ආරක්ෂක සහ තාක්ෂණික ප්‍රමිතීන් නියම කිරීම
- වාර්තා කිරීමේ, අනුකූලවීමේ සහ වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවය ඇතුළුව බලපත්‍ර හිමියන්ගේ බැඳීම් විස්තර කිරීම
- බලපත්‍රයක් නොමැතිව ක්‍රියාත්මක වීම, කොන්දේසි උල්ලංඝනය කිරීම හෝ නියාමන අධීක්ෂණයට බාධා කිරීම සඳහා දඬුවම් ස්ථාපිත කිරීම
- දැනට සිටින මෙහෙයුම්කරුවන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ බලතල, බලාත්මක කිරීමේ අධිකාරිය සහ සංක්‍රාන්ති විධිවිධාන ඇතුළු අනුබද්ධ විධිවිධාන සැලසීම.

### 2. ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත

අංකය: 2006 අංක 6

තත්ත්වය: ඉදිරිපත් කළ දිනය (පළමුවෙනි වර කියවීම) - 2026 ජනවාරි 20

අරමුණ:1972 අංක 7 දරන ගෙවල් කුලී පනත අවලංගු කිරීම

ප්‍රධාන විධිවිධාන:

- ව්‍යවස්ථාපිත ගෙවල් කුලී පාලනය සහ අදාළ විධිවිධාන අවසන් කරමින් 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත අහෝසි කිරීම
- ගෙහිමි-කුලී නිවැසි සම්බන්ධතා පාලනය කිරීම සඳහා කුලී අයිතිය සහ ගෙවල් කුලිය සම්බන්ධ කරුණු යාවත්කාලීන කරන ලද ප්‍රඥප්ති, නැත හොත් නියෝග වලට මාරු කිරීම
- අහෝසි කරනු ලැබීමෙන් පසුව දැනට පවතින කුලී ගිවිසුම් සහ ආරවුල් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පැහැදිලි කිරීම
- පැරණි පනත යටතේ "බලයලත් කුලී" සහ කුලී තීරණය කිරීමේ යාන්ත්‍රණයන් වෙත යොමු කිරීම් සිදුකිරීම ඉවත් කිරීම
- දැනට පවතින කුලීකර ගිවිසුම්වල සහ නෛතික ක්‍රියාමාර්ගවල අඛණ්ඩතාව සහතික කිරීම සඳහා සංක්‍රාන්ති විධිවිධාන සැපයීම

### 3. නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

අංකය: 2026 අංක 5

තත්ත්වය: ඉදිරිපත් කළ දිනය (පළමුවෙනි වර කියවීම) - 2026 ජනවාරි 20

අරමුණ: 1972 අංක 10 දරන පනත සංශෝධනය කිරීම

ප්‍රධාන විධිවිධාන:

- කන්ටේනර් මෙහෙයුම්කරුවන් ප්‍රධාන පනතේ විෂය පථයෙන් ඉවත් කිරීම
- කන්ටේනර් මෙහෙයුම්කරුවන් ඉවත් කිරීම පිළිබිඹු කිරීම සඳහා දීර්ඝ නාමය සහ අර්ථ දැක්වීම් සංශෝධනය කිරීම
- පවතින බලපත්‍රවල සහ අයදුම්පත්‍ර වල වලංගුභාවය ආරක්ෂා කිරීම, ඒවා සම්බන්ධයෙන් කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන් පිළිබඳ නව නීතිය යටතේ කටයුතු කිරීමට ඉඩ සැලසීම
- මෙම නීතිය සංශෝධිත විෂය පථය සමග අනුකූල කිරීම සඳහා කන්ටේනර් මෙහෙයුම්කරුවන් පිළිබඳව සඳහන් වන වගන්තිවලට ආනුෂංගික සංශෝධන සිදු කිරීම
- නැව් නියෝජිතයන්, නැව් බඩු ගෙනයන්නන් සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන් අඛණ්ඩව නියාමනය කිරීම සහතික කිරීම

## 4. පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත

අංකය: 2026 අංක 4

තත්ත්වය: ඉදිරිපත් කළ දිනය (පළමුවෙනි වර කියවීම) - 2026 ජනවාරි 20

අරමුණ: නීත්‍යානුකූල නොවන නෙරපීම වැළැක්වීම

ප්‍රධාන විධිවිධාන:

- "පදිංචිකරු" යන්න නිර්වචනය කර, නීත්‍යානුකූලව පදිංචිවී සිටින පුද්ගලයන් අධිකරණ නියෝගයකින් තොරව නෙරපනු ලැබීමෙන් ආරක්ෂා කිරීම.
- පදිංචිකරුවන්ට ඉවත්ව යෑමට සැලැස්වීම සඳහා ඉඩම් හිමියන් විසින් උපයෝගිතා සේවා කපා හැරීම හෝ අත්‍යවශ්‍ය සේවා ඉවත් කිරීම තහනම් කිරීම.
- උපයෝගිතා සේවා නැවත ස්ථාපනය කිරීම සඳහා හෝ බුක්තිය ආරක්ෂා කර ගැනීම සඳහා අධිකරණයට අයදුම් කිරීමේ අයිතිය පදිංචිකරුවන්ට ලබා දීම.
- කාලරාමු, විභාග කිරීම් සහ කඩිනම් සහන යාන්ත්‍රණ ඇතුළුව නෙරපා හැරීමේ ආරවුල් සඳහා කාර්ය පටිපාටික නීති ස්ථාපනය කිරීම.
- පදිංචිකරුවන්ගේ ආරක්ෂාවට අදාළ අධිකරණ නියෝගවලට අපහාස කිරීම හෝ එම නියෝග ක්‍රියාත්මක කිරීමට බාධා කිරීම සඳහා දඬුවම් නියම කිරීම.

## 5. පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් ඉවත් කිරීමේ පනත් කෙටුම්පත

අංකය: 2026 අංක 1

තත්ත්වය: ඉදිරිපත් කළ දිනය (පළමුවෙනි වර කියවීම) - 2026 ජනවාරි 07

අරමුණ: 1977 අංක දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් නීතිය අහෝසි කිරීම

ප්‍රධාන විධිවිධාන:

- 1977 අංක දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් නීතිය අහෝසි කිරීම.
- එම නීතිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හිමිවන වන සියලුම විශ්‍රාම වැටුප් හිමිකම් නතර කිරීම
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් ලබා දෙන ව්‍යවස්ථාපිත විධිවිධාන ඉවත් කිරීම
- වර්තමාන සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා දැනට පවතින විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය නිශ්චිතව දැක්වීම
- අනෙකුත් නීති සමග නෛතික අනුකූලතාවය සහතික කිරීම සඳහා සංක්‍රාන්ති විධිවිධාන ඇතුළත් කිරීම.

## 6. යූඑන්වී පදනම සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත

අංකය: 2026 අංක 3

තත්ත්වය: ගැසට් පත්‍රයේ පළකර ඇත - 2026 ජනවාරි 09

අරමුණ: යූඑන්වී පදනම සංස්ථාගත කිරීම

ප්‍රධාන විධිවිධාන:

- අවිච්ඡින්න පැවැත්මක් සහිත නෛතික අස්තිත්වයක් ලෙස යූඑන්වී පදනම සංස්ථාගත කිරීම
- පදනමේ අරමුණු, බලතල සහ කාර්යයන් නිශ්චිතව දැක්වීම
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ රාජකාරි ඇතුළුව පාලන සහ කළමනාකරණ ව්‍යුහය ස්ථාපනය කිරීම
- පදනමට සහභාගිවන්නන්ගේ සාමාජික අයිතිවාසිකම් සහ බැඳීම් නිර්වචනය කිරීම
- පරිපාලනය, අරමුදල් සැපයීම, අනුකූලතාවය සහ වාර්තා කිරීම සම්බන්ධ ආනුෂංගික විධිවිධාන සැලසීම

## III. තෝරාගත් අමාත්‍ය මණ්ඩල තීරණ

### කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග

- **මහවැලි අධිකාරිය සතු ගොවිපළ වගාභූමි දේශීය ගොවීන්ට ලබා දීම (2026 ජනවාරි 26)**

  ඵලදායිතාව, ජාතික බිත්තර වී සැපයුම සහ ප්‍රජාවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා මහවැලි අධිකාරිය සතුව ඉඩම් අයිතිය තබා ගනිමින් මහවැලි අධිකාරිය යටතේ ඇති ගොවිපළ 17 ක් දේශීය ගොවීන්ට බදු පදනම මත ලබාදීම අනුමත කර ඇත. මෙය තරුණ කෘෂි ව්‍යවසායකයින් සහ තිරසාර ගොවිතැන දිරිමත් කරයි.

- **රජයේ ඉඩම් ආඥා පනත සහ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරනු ලැබ ඇති චක්‍රලේඛ සංශෝධනය කිරීම (2026 ජනවාරි 26)**

  ආයෝජකයින් සම්බන්ධකර ගැනීම විධිමත් කිරීම පිණිස රජයේ ඉඩම් වෙන් කිරීදීමේ කාර්ය පටිපාටි, දීමනා පත්‍ර නිකුත් කිරීම, බදු ගණනය කිරීම් සහ ගාස්තු යාවත්කාලීන කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේ ය. මෙමගින් ආයෝජන කාර්ය පටිපාටි සරල කරන අතර, නිලධාරිවාදී ප්‍රමාදයන් අඩු කරයි.

- **කිවුල් ඔය ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම (2026 ජනවාරි 19)**

  මුලතිව් සහ වවුනියාව ප්‍රදේශවල ජල හිගය විසඳීම සහ එම ප්‍රදේශවල සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා 2031 වර්ෂය වන විට නිමකිරීමට සැලසුම් කරමින්, රුපියල් මිලියන 23,456 ක සංශෝධිත අයවැයක් මගින් කිවුල් ඔය ව්‍යාපෘතිය (2023 වර්ෂයේ දී තාවකාලිකව නවතා දමන ලද) නැවත ආරම්භ කිරීම අනුමත කරන ලදී. 2011 වර්ෂයේ දී මුලින් ම අනුමත කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදල් භාවිතා කරනු ලැබේ.

- **සම්බා සහ කිරි සම්බා වී මිලදී ගැනීමේ අවම මිල ඉහළ නැංවීම (2026 ජනවාරි 12)**

  සම්බා සහ කීරි සම්බා වී වර්ග වගා කිරීම දිරිමත් කිරීම පිණිස, සම්බා වී මිලදී ගැනීමේ අවම මිල රු. 125 සිට රු. 130 දක්වා සහ කිරි සම්බා වී මිලදී ගැනීමේ අවම මිල රු. 132 සිට රු. 140 දක්වා ඉහළ නැංවීමටත්, නාඩු වී මිලදී ගැනීමේ අවම මිල රු. 120 ලෙස තවදුරටත් පවත්වා ගැනීමටත් අනුමත කරන ලදී. මිල කමිටුවේ සහ ආහාර ප්‍රතිපත්ති සහ සුරක්ෂිතතා කමිටුවේ නිර්දේශ මත පදනම්ව මෙම මිල ගණන් තීරණය කර ඇත.

- **ආපදාවෙන් බලපෑමට ලක් වූ ගම්මිරිස්, කෝපි සහ කරදමුංගු වගාවන් සඳහා සහන සැලසීම (2026 ජනවාරි 05)**

  හානියට පත් දිගුකාලීන අපනයන භෝග නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රු. 425,000 ක් දක්වා වූ දීමනාවක් ගෙවීම සහ දිගුකාලීන අපනයන බෝග වගා නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නොමිලයේ පැල ලබා දීම අනුමත කරන ලදී. මෙය අපනයන කෘෂිකර්ම අංශය නැවත යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී වේ.

### මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන

- **සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මානව සම්පත් උපයෝජනය පිළිබඳ නව චක්‍රලේඛ නිකුත් කිරීම** (2026 ජනවාරි 26)

  රජයේ සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම පිණිස සහ මානව/භෞතික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහතික කිරීම පිණිස 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අවලංගු කර යාවත්කාලීන කරන ලද චක්‍රලේඛ නිකුත් කරන ලදී. මෙමගින් ව්‍යාපෘති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාග්ධන වියදම්වල ප්‍රතිලාභ කාලෝචිත ආකාරයට ලබා දීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

- **ආදායම් සංරක්ෂණ පනත යටතේ සාදන ලද ආඥාව සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ සාදන ලද නියමයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම** (2026 ජනවාරි 26)

  දෙමුහුන් වර්ගයේ මැන්ඩරින් පළතුරු විශේෂය සඳහා සංශෝධිත බද්ද සහ අර්තාපල් සහ බොම්බයි ළූණු සඳහා පැවති බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම ඇතුළුව 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත සහ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පනත යටතේ සාදන ලද නියමයන්/නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. දිට්වා සුළි කුණාටුවෙන් පසු ලැබෙන පරිත්‍යාග සඳහා බදු අයකිරීමේ ක්‍රියාමාර්ග සහ සහන සැපයීම සාඳහා නෛතික අනුමැතිය ලබා දෙන ලදී.

- **ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සඳහා පනත් කෙටුම්පත කෙටුම්පත් කිරීම** (2026 ජනවාරි 19)

  ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයට ඵලදායී ලෙස සහ මූල්‍යමය වශයෙන් තිරසාර ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය බලතල ලබා දෙමින් එම ආයතනය සංස්ථාගත කිරීම සඳහා වන පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම අනුමත කරන ලදී. මෙමගින් එම ආයතනය රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියමයන්ට අනුකූල වන අතර, රක්ෂණ නියෝජිතයින්ට බලපත්‍ර ලබා දීම සඳහා එය අත්‍යාවශ්‍ය වේ.

- **මතුපිට උද්ධමනය පහත වැටීම පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම** (2026 ජනවාරි 19)

  මතුපිට උද්දමනය අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා උද්දමන ඉලක්කයට වඩා පහළින් පැවතීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(5) වගන්තිය යටතේ 2025 වර්ෂයේ දෙවන සහ තුන්වන කාර්තු සඳහා වන කාර්තුමය මතුපිට උද්ධමනය (-1.1% සහ 0.8%) පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. එය උද්ධමන වාර්තා පිළිබඳ විනිවිදභාවය සහ මහජන ප්‍රවේශ්‍යතාවය පවත්වා ගැනීමට උපකාරී වෙයි.

- **මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ පනත් සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම** (2026 ජනවාරි 12)

  මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වන සංශෝධන පනත් කෙටුම්පත් ගැසට් පත්‍රයේ පළ කර, ඉන් පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. නීතිපතිවරයාගේ නිෂ්කාශනය ලැබී තිබේ; පූර්ව අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසුව සිදු කරන ලදී (2025 මැයි 26).

- **රජය සතු බංගලා/නිවාස රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් යටතේ ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීම** (2026 ජනවාරි 05)

  තානාපති කාර්යාල, ජාත්‍යන්තර සංවිධාන, කුඩා හෝටල් (boutique hotels) සහ අනෙකුත් ඵලදායී ව්‍යාපෘති සඳහා බංගලා සහ නිවාස 24 ක් වසර තිහක (30) කාලයකට බදු දීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම් කැඳවීම අනුමත කරන ලදී. එය 2024 දෙසැම්බර් මාසයේ දී පත් කරන ලද නිලධාරීන්ගේ කමිටුවේ නිර්දේශ අනුව සිදු කරනු ලැබේ.

- **ජාතික ලොත/යි මණ්ඩලය සඳහා නව පනතක් හඳුන්වාදීම** (2026 ජනවාරි 05)

  ජාතික ලොත/යි මණ්ඩල පනත (1963 වර්ෂයේ දී පනවන ලද) යාවත්කාලීන කිරීම සඳහා අලුතින් සංශෝධන ඇතුළත් කරමින් පනත් කෙටුම්පත සකස් කර නිම කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම අනුමත කරන ලදී. නවීන වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා වර්තමාන ලොත/යි රාමුව ප්‍රතිසංස්කරණය කිරීම මෙහි අරමුණ වේ.

- **ඇමරිකා එක්සත් ජනපදය වෙත යවනු ලබන තැපැල් භාණ්ඩ සඳහා විශ්ව තැපැල් සංගමය විසින් හඳුන්වා දී ඇති තැපැල් මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම** (2026 ජනවාරි 19)

  ශ්‍රී ලාංකික ව්‍යාපාර මත ඇමරිකානු ඩොලර් 800 ක තීරු බදු රහිත අවම නිදහස් කිරීම ඉවත් කිරීමෙහි බලපෑම අවම කිරීම සඳහා, ඇමරිකා එක්සත් ජනපදයට යවනු ලබන තැපැල් භාණ්ඩ සඳහා තීරුබදු ගෙවීමට පහසුකම් සැලසීම පිණිස විශ්ව තැපැල් සංගමය විසින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශ අනුගමනය කිරීම අනුමත කරන ලදී. මෙය විද්‍යුත්-වාණිජ්‍ය (e-commerce) අපනයනකරුවන්ට උපකාරී වන වන අතර, ජාත්‍යන්තර තැපැල් රෙගුලාසි වලට අනුකූල වීම ද සහතික කිරීම.

## සෞඛ්‍ය

- **මාතර මහ රෝහල නැවත ස්ථාපනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනය** (2026 ජනවාරි 26)

මීන් පෙර අනුමත කර තිබූ 'වෛද්‍ය උපකරණ අංශ සංවර්ධන ණය ව්‍යාපෘතිය' අවලංගු කර, මාතර මහ රෝහල නැවත ස්ථාපනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කොරියානු අපනයන - ආනයන (එක්සිම්) බැංකුවෙන් අරමුදල් ලබා ගැනීම අනුමත කරන ලදී. මෙමගින් මෙම රෝහලේ ප්‍රතිසංවර්ධනය වර්තමාන ජාතික සෞඛ්‍ය අවශ්‍යතා වලට අනුකූල කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

- **ප්‍රාථමික සත්කාර සේවා තුළ අධි රුධිර පීඩනය සහ දියවැඩියාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම** (2026 ජනවාරි 12)

මුල් අදියරෙහි ඉතිරිව පවතින අරමුදල් සහ 'Resolve to Save Lives' ආයතනය විසින් ලබා දෙනු ලබන ඇමරිකානු ඩොලර් 242,125 ක අතිරේක ප්‍රදානයක් භාවිතා කරමින් දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය

ගාල්ල, කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීම අනුමත කරන ලදී. කළුතර, මහනුවර, නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ නියමු ව්‍යාපෘතියෙහි සාර්ථකත්වය පදනම් කර ගෙන ක්‍රියාත්මක කරනු ලැබේ.

- **වෛද්‍ය සැපයීම් සඳහා නිරවුල් නොකළ ගෙවීම් නිරවුල් කිරීම (2008-2023)** (2026 ජනවාරි 12)

  2018 ජනවාරි 1 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා ගෙවිය යුතු රු.බි. 23.87 ක මුදල වාරික වශයෙන් ගෙවීම අනුමත කරන ලද අතර, 2008-2017 කාලය සඳහා ගෙවිය යුතු මුදල ගණනය කරමින් පවතියි. මෙමගින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ගෙවිය යුතු හිග මුදල් ගැටළුව විසඳයි.

- **කාර්ය සාධනය මත පදනම් වූ ගෙවීම් ක්‍රමයකට අනුව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ රජයේ රෝහල්වල රෝග විනිශ්චය උපකරණ භාවිතා කිරීම** (2026 ජනවාරි 05)

  පොරොත්තු කාලය අඩු කිරීම සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම පිණිස රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ සේවා සහ උපකරණ (CT සකෑනර්, MRI ස්කෑනර්, DSA, හෘද කැතීටකරණ ඒකක, ස්වයංක්‍රීය විශ්ලේෂක) ලබා ගැනීම අනුමත කරන ලදී. මූල්‍ය/ප්‍රසම්පාදන සීමාකිරීම්වල බලපෑම වළක්වා ගනිමින් ඉහළ මට්ටමේ රෝග විනිශ්චයක් සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම මෙහි අරමුණ වේ.

- **රජයේ රෝහල්වල රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන් යටතේ රුධිර කාන්දුකරණ සේවා පුළුල් කිරීම** (2026 ජනවාරි 05)

- හඳුනාගත් රෝහල්වල රුධිර කාන්දුකරණ සේවා ව්‍යාප්ත කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව යාන්ත්‍රණයක් යොදා ගැනීම අනුමත කරන ලදී; මේ යටතේ පුද්ගලික අංශයේ හවුල්කරු යන්ත්‍ර, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, ක්‍රියාකාරීත්වය සහ නඩත්තුව සඳහා මුදල් සපයන අතර රජය යටිතල පහසුකම් සහ අධීක්ෂණය සපයා දෙයි. මෙය මහනුවර ජාතික රෝහලේ ක්‍රියාත්මක වන ආකෘතියෙහි සාර්ථකත්වය පදනම් කරගෙන ක්‍රියාත්මක කරන අතර, ඉහළ යමින් පවතින සායනික ඉල්ලුමට විසඳුම් සපයා දෙයි.

## ප්‍රවාහන මහාමාර්ග සහ නාගරික සංවර්ධන

- **විනෝදාස්වාද ව්‍යාපෘති සඳහා දියවන්නා ඔය දෙපස ඉඩම් (බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයට යාබද) බැහැර කිරීම** (2026 ජනවාරි 26)

  තරකාරී ප්‍රසම්පාදන ක්‍රමය භාවිතා කරමින් 'ෆ්‍රොලික් අයිලන්ඩ් විනෝදාත්මක මධ්‍යස්ථාන' (Frolic Island Recreational Hub) සඳහා දියවන්නා ඔය දෙපස අක්කර 13.57 ක් බදු දීම සඳහා ආයෝජන යෝජනා කැඳවීම අනුමත කරන ලදී. මෙය ගංවතුර වැළැක්වීමේ සහ නාගරික සංවර්ධන වැඩසටහන්වල කොටසක් වේ.

- **මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සඳහා කොළඹ 03, බාලදක්ෂ මාවතේ පිහිටි ඉඩම බැහැර කිරීම** (2026 ජනවාරි 26)

  තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් යටතේ, කොළඹ නගරයේ උසම මිශ්‍ර-භාවිත සංවර්ධනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වසර 99 ක කල්බදු මත හෙක්ටයාර 0.42 ක ඉඩමක් ලබා දීම සඳහා යෝජනා කැඳවීම අනුමත කරන ලදී. නාගරික සංවර්ධන සැලසුම් වලට සහ ප්‍රසම්පාදන නීතිරීතිවලට අනුකූල වීම සහතික කරමින් මෙය සිදු කරනු ලැබේ.

- **නුවරඑළිය, ඩන් අතුරු මාර්ගයට යාබද ඉඩම තේමා උද්‍යානයක් සඳහා බැහැර කිරීම** (2026 ජනවාරි 26)

  සංචාරකයින් ආකර්ෂණය කර ගන්නා විනෝදාස්වාද ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම සඳහා ග්‍රෙගරි වැවට යාබද අක්කර 10.97 ක් වසර 50 ක කාලයක් සඳහා බදු දීමට යෝජනා කැඳවීම අනුමත කරන ලදී. ජාත්‍යන්තර තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

- **ආවාරන්කාල් - තොණ්ඩමනාරු (B-033) අධිවේගී මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම** (2026 ජනවාරි 26)

  ප්‍රදේශයේ සමාජ-ආර්ථික ප්‍රවේශය වැඩිදියුණු කිරීම, ගමනාගමනය පහසු කිරීම සහ ප්‍රධාන පහසුකම් සම්බන්ධ කිරීම පිණිස මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නෙම් කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම අනුමත කරන ලදී. ජාතික තරගකාරී ලංසු ක්‍රමය සහ ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු නිර්දේශ අනුගමනය කරමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

- **2025 අංක 04 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාලය තාවකාලිකව දීර්ඝ කිරීමේ) නියෝග** (2026 ජනවාරි 26)

2025 නොවැම්බර් මාසයේ දී පැවති දේශගුණික තත්ත්වය සහ තාක්ෂණික ගැටළු හේතුවෙන් සිදුවූ බලපත්‍ර නැවත අලුත් කිරීමේ ප්‍රමාදයන්ට විසඳුම් ලෙස තාවකාලිකව දීර්ඝ කිරීමේ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. බලපත්‍ර අලුත් කිරීම පැහැර හැරීම මගින් මාර්ග ආරක්ෂාවට ඇතිවන බලපෑම වළක්වා ගැනීම මෙහි අරමුණ වේ; බලපත්‍රවල වලංගු කාලය මාස එකකින් දීර්ඝ කරනු ලැබේ.

- **බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ III වෙනි අදියර ක්‍රියාත්මක කිරීම** (2026 ජනවාරි 19)

  මාර්ග තදබදය අඩු කිරීම, නාගරික සංචලනය වැඩිදියුණු කිරීම සහ ආර්ථික ඵලදායිතාව වැඩි කිරීම සඳහා බේස්ලයින් මාර්ගයේ කිරුළපන හන්දියේ සිට දුටුගැමුණු මාවත දක්වා කිලෝමීටර් 0.86 ක කොටස මංතීරු හයක් සහිතව සංවර්ධනය කිරීම නැවත ආරම්භ කිරීම අනුමත කරන ලදී. අවශ්‍ය ඉඩම්වලින් 90% ක් දැනටමත් අත්පත් කරගෙන ඇත; ජාතික මාර්ග ප්‍රධාන සැලැස්ම අනුගමනය කරමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

- **දිට්වා සුළි කුණාටුවෙන් පසු ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා උපදේශන ආයතන තෝරා ගැනීම** (2026 ජනවාරි 12)

  සුළි කුණාටුවෙන් පසු මාර්ග, දුම්රිය මාර්ග සහ සේවා යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීම පිණිස වසර 2 ක කාලයක් සඳහා සුදුසුකම් ලත් උපදේශන ආයතන ලියාපදිංචි කිරීම සහ තරගකාරී ලංසු කැඳවීම අනුමත කරන ලදී. සැලසුම් කිරීම, අධීක්ෂණය සහ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අවශ්‍ය වෘත්තීය කාර්ය මණ්ඩල හිඟය විසඳීම මෙහි අරමුණ වේ.

- **රජයේ දෙපාර්තමේන්තු වල භාවිතයට ගත නොහැකි වානේ බැහැර කිරීම** (2026 ජනවාරි 12)

  ජාතික තරගකාරී ලංසු කැඳවීම සහ ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු නිර්දේශ මත, රු.මි. 114.51 ක් වටිනා භාවිතයට ගත නොහැකි වානේ එස්.ආර්. ස්ටීල් (පුද්) සමාගම වෙත බැහැර කිරීම අනුමත කරන ලදී. බහුවිධ වානේ අයිතම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම ඇතුළත් වේ.

- **මහයියාව දුම්රිය මාර්ගයට පහළින් (A-009 මාර්ගයේ) යටිබිම් පාලම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම** (2026 ජනවාරි 05)

  ජාතික තරගකාරී ලංසු කැඳවීම සහ ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු නිර්දේශ මත රු.මි. 699.58 ක (බදු රහිත) මුදලකට නෙම් කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගමට මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම අනුමත කරන ලදී. මහනුවර-යාපනය මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙය ඉදිකරනු ලැබේ.

- **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සඳහා වාහන අංක තහඩු ප්‍රසම්පාදනය** (2026 ජනවාරි 05)

  ජාතික තරගකාරී ලංසු කැඳවීම සහ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ නිර්දේශ මත පදනම්ව වසර 5 ක කාලයක් සඳහා වාහන අංක තහඩු සැපයීමේ කොන්ත්‍රාත්තුව සවුත් ඒසියන් ටෙක්නොලොජීස් සමාගම වෙත ප්‍රදානය කිරීම අනුමත කරන ලදී. වාහන ලියාපදිංචි කිරීමේ යටිතල පහසුකම් අඛණ්ඩව පවත්වා ගැනීම සහතික කිරීම මෙහි අරමුණ වේ.

- **2022 අංක 3 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර අයභාර) නියෝග සංශෝධනය කිරීම** (2026 ජනවාරි 05)

  තාවකාලික රියදුරු බලපත්‍ර ගාස්තු (බණ්ඩාරනායක ගුවන්තොටුපළ සේවාව) සංශෝධනය කිරීම සඳහා වන සංශෝධිත නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී. මෙම ගාස්තුව රු. 2,000 ක් ලෙස යාවත්කාලීන කිරීම සහ සේවා තිරසාරභාවය සහතික කිරීම මෙහි අරමුණ වේ.

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන

- **කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත් කිරීම** (2026 ජනවාරි 26)

  පූර්ණ කාලීන පදනමින් මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස දිල්කි වත්සලා මාරඹගේ මහත්මිය පත් කිරීම අනුමත කරන ලදී. තනතුරෙහි පුරප්පාඩුව පිරවීම මෙහි අරමුණ වේ. ඒ මහත්මිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියකි.

- **2026 වර්ෂයේ දී පාසල් ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා පසල් සිසුන්ට දීමනාවක් ලබා දීමේ වැඩසටහන** (2026 ජනවාරි 12)

  සුදුසුකම් ලත් අස්වැසුම ප්‍රතිලාභී පවුල්වල, කුඩා පාසල්වල, පිරිවෙන්වල සහ ළමා සංවර්ධන

මධ්‍යස්ථානවල සිටින පාසල් සිසුන් සඳහා පාසල් ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම පිණිස මෙම වසරේ දී ද එක් ළමයෙකුට රු. 6,000 ක දීමනාවක් ගෙවීම අනුමත කරන ලදී. මෙය 2025 වර්ෂයේ ආරම්භ කළ වැඩසටහන ඉදිරියට ගෙනයාමකි. (2026 ජනවාරි 05)

- **ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල සහ විදේශීය විශ්වවිද්‍යාල අතර අවබෝධතා ගිවිසුම්වලට එළඹීම** (2026 ජනවාරි 05)

  අධ්‍යයන/පර්යේෂණ සහයෝගීතාවය, හුවමාරු වැඩසටහන් සහ ඒකාබද්ධ සම්මන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම සඳහා භික්ෂු විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව) සහ මහාමකුට් බෞද්ධ විශ්වවිද්‍යාලය (තායිලන්තය); භික්ෂු විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව) සහ නාලන්දා ආයතනය (ජකර්තා); සහ කොළඹ විශ්වවිද්‍යාලය සහ එස්.ජී.එච්. වෝර්සෝ ආර්ථික විද්‍යා පාසල (පෝලන්තය) අතර වසර 5 ක අවබෝධතා ගිවිසුම් අනුමත කරන ලදී. මෙමගින් අධ්‍යාපන ප්‍රමිතීන්, ජාත්‍යන්තර අත්දැකීම් සහ පර්යේෂණ සහයෝගීත්වයන් පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

## කාන්තා හා ළමා කටයුතු

- **කාන්තා හා ළමා කටයුතු පිළිබඳ නව නීති සහ සංශෝධන හඳුන්වාදීම** (2026 ජනවාරි 26)

  ළමයින්ට එරෙහි සයිබර් අපරාධ පිළිබඳ නව පනතක්, ළමා අයිතිවාසිකම් පිළිබඳ නව පනතක්, ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ නව පනතක්, සහ කැපකරු මාපිය /කචරණය සඳහා නව පනතක් හඳුන්වා දීම සහ ළමයින් සම්බන්ධයෙන් පවතින ආඥා පනත් කිහිපයක් සංශෝධනය කිරීම අනුමත කරන ලදී. දේශීය නීති එක්සත් ජාතීන්ගේ සම්මුතීන් සහ නවීන නීති ප්‍රමිතීන් සමග අනුකූල කිරීම මෙහි අරමුණ වේ.

## පරිසර

- **කැලිඩෝ වෙරළ තීරය සහ කළු ගඟ ඩෙල්ටාව නැවත ප්‍රතිස්ථාපනය කිරීම** (2026 ජනවාරි 26)

  වැලි කඳු ප්‍රතිස්ථාපනය කිරීම, ගංගාවේ ඩෙල්ටාව ස්ථාවර කිරීම සහ වෙරළ ඛාදනය, කලපු දූෂණය සහ පාරිසරික ගැටළු විසඳීම සඳහා මෙම ව්‍යාපෘතිය අනුමත කරන ලදී. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව මගින් මෙය ක්‍රියාත්මක කරනු ලැබේ. සංචාරක ව්‍යාපාරය සහ යටිතල පහසුකම් ආරක්ෂා කිරීම මෙහි අරමුණ වේ.

## වරාය සහ ගුවන් සේවා

- **ශ්‍රී ලංකා වරාය සහ සැපයුම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමක් අත්සන් කිරීම** (2026 ජනවාරි 26)

  මෙහෙයුම්, තාක්ෂණික, මූල්‍ය සහ ප්‍රසම්පාදන අංශ අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සමග ඩී.ජ.ඩො.මි. 3.0 ක ප්‍රදානයක් සඳහා ගිවිසුමක් අත්සන් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපනය කිරීම අනුමත කරන ලදී. මෙය යටිතල පහසුකම් නවීකරණයට සහ සැපයුම් සැලසුම්කරණයට උපකාරී වේ.

- **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ව්‍යවහාර මුදල් මාරු කිරීමේ කවුළු ක්‍රියාත්මක කිරීම** (2026 ජනවාරි 12)

  පැමිණීමේ පර්යන්තයේ මුදල් මාරු කිරීමේ කවුළු 5 ක් පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන නිර්දේශ මත පදනම්ව කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව, තෝමස් කුක් ලංකා, සම්පත් බැංකුව සහ මහජන බැංකුව වෙත වසර 3 ක් සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම අනුමත කරන ලදී. මෙය ගුවන් තොටුපළ නැවත සංවර්ධනය කිරීම සහ මගී සේවා සපයාදීම සඳහා උපකාරී වේ.

## ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම්

- **'ප්‍රජාශක්ති' දිළිඳු බව තුරන් කිරීමේ ව්‍යාපාරය යටතේ 2026 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමේ කාර්ය පටිපාටිය** (2026 ජනවාරි 26)

  2030 වර්ෂය වන විට බහුමාන දරිද්‍රතාවය ඒකක 5 ක ප්‍රමාණයකින් අඩු කිරීම සඳහා අංශ හයක දිස්ත්‍රික් සහ ජාතික මට්ටමේ ව්‍යාපෘති සඳහා රුපියල් බිලියන 25 ක ප්‍රතිපාදනයක් අනුමත කරන ලදී. පුහුණු වැඩසටහන්, පර්යේෂණ සහ ප්‍රජා මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙයට ඇතුළත් වේ.

- **ත්‍රිපෝෂ වැඩසටහන සඳහා ඔරොත්තු දෙන, බඩ ඉරිඟු පදනම් කර ගත් ආහාර පද්ධතියක් ගොඩනැගීම** (2026 ජනවාරි 05)

  ලෝක ආහාර වැඩසටහනේ සහාය ඇතිව ත්‍රිපෝෂ වැඩසටහනේ ගුණාත්මකභාවය සහ බඩ ඉරිඟු සැපයුම් දාමය වැඩි දියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතියක් අනුමත කරන ලදී; මේ සඳහා කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයෙන් (KOICA) වෙතින් එ.ජ.ඩො.මි. 10 ක ප්‍රදානයක් ලැබෙන අතර, අනුරාධපුර, මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කවල ආසන්න වශයෙන් 7,500 පමණ ගොවීන්ට ප්‍රතිලාභ ලැබේ; 2025-2029 කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතය. අත්සන් කිරීමේ සාකච්ඡාව පිළිබඳ සටහන් සහ විෂය පථය ඇතුළත් වේ.

## ඩිජිටල් ආර්ථික

- **ස්වයංක්‍රීය වර්ණාවලි කළමනාකරණ පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීම** (2026 ජනවාරි 26)

  දශක දෙකක් පැරණි SPECTRAplus නැමති පද්ධතිය ප්‍රතිස්ථාපනය කර ජාතික සංඛ්‍යාත කළමනාකරණය කිරීම සඳහා නවීන ස්වයංක්‍රීය පද්ධතියක් මිලදී ගැනීම අනුමත කරන ලදී. කාර්යක්ෂමතාව, නියාමන අනුකූලතාවය සහ ඩිජිටල් සේවා සමග ඒකාබද්ධ කිරීම වැඩි දියුණු කිරීම මෙහි අරමුණ වේ.

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන

- **රොක් පොස්පේට් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය** (2026 ජනවාරි 26)

  ලංකා පොස්පේට් සමාගම විසින් කැණීම් කරනු ලබන පොස්පේට් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් සඳහා තෝරාගත් ආයෝජකයින්ගෙන් ව්‍යාපෘති යෝජනා කැඳවීම අනුමත කරන ලදී. 2025 අගෝස්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ පෙර තීරණය පදනම් කරගෙන ඇත; ආයෝජකයින් 14 දෙනෙකුගෙන් අභිලාෂයන් ලැබී ඇත.

- **පැලවත්ත සීනි කර්මාන්ත ශාලාවේ තෝරාගත් ස්ථාන සංචාරක ආකර්ෂණීය ස්ථාන ලෙස සංවර්ධනය කිරීම** (2026 ජනවාරි 12)

  පැලවත්ත සීනි කර්මාන්ත ශාලාවේ තෝරාගත් ස්ථාන සංචාරක ආකර්ෂණීය ස්ථාන ලෙස සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් යටතේ යෝජනා කැඳවීම අනුමත කරන ලදී. නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් සුදුසු ආයෝජකයන් හඳුනා ගනු ලැබේ.

## ධීවර, ජලජ සහ සාගර සම්පත්

- **ඉන්දියානු සාගර වෙරළබඩ රාජ්‍ය සන්ධානය පිහිටුවීම සඳහා වන අවබෝධතා ගිවිසුම** (2026 ජනවාරි 19)

  ටූනා ධීවර කර්මාන්තයේ තිරසාර කළමනාකරණය, මත්ස්‍ය ජනගහනය වැඩිදියුණු කිරීම සහ වෙරළබඩ ප්‍රජාවන්ගේ ජීවනෝපායන්ට සහාය වීම සඳහා සන්ධානයක් ස්ථාපනය කිරීම පිණිස ඉන්දියානු සාගර රටවල් 11 ක් සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම අනුමත කරන ලදී. මෙය කලාපීය සහයෝගීතාවය සහ ආහාර සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීමට උපකාරී වේ.

- **ජාතික ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම** (2026 ජනවාරි 12)

  සාධාරණ ප්‍රතිලාභ, තිරසාර කළමනාකරණය සහ අනෙකුත් අදාළ ප්‍රතිපත්ති සමග ඒකාබද්ධ කිරීම සහතික කිරීම පිණිස යාවත්කාලීන කරන ලද ජාතික ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. පොහොසත් රටක් - ලස්සන ජීවිතක්' ප්‍රතිපත්තියට අනුකූලව වන ලෙස යාවත්කාලීන කර නැවත කෙටුම්පත් කරන ලදී.

## වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම්

- **වතු කම්කරුවන් සඳහා 2026 අයවැය සහන ලබා දීම** (2026 ජනවාරි 19)

  2026 ජනවාරි 1 වෙනි දින සිට මාස හයක් සඳහා වතු සමාගම් හරහා ගෙවමින්, ඉන් පසුව සෘජුව ම වතු කම්කරුවන්ගේ බැංකු ගිණුම්වලට බැර කරමින් වතුකම්කරුවන් සඳහා වන දිරි දීමනාව (දෛනික

වැටුප රු. 1,550 + පැමිණීමේ දීමනාව රු. 200) ගෙවීමේ ක්‍රමවේදය අනුමත කරන ලදී. මේ සඳහා 2026 අයවැයෙන් රු. මි. 5,000 ක් වෙන් කර ඇත. වතු සේවකයින්ගේ ජීවන තත්ත්වය නංවාලීම මෙහි අරමුණු වේ.

- **ඌන උපයෝජිත ඉඩම්/දේපළ සුදුසු ආයෝජකයන්ට ලබා දීම** (2026 ජනවාරි 12)

  ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට, ඇල්කඩුව වැවිලි සමාගමට, තේ ශක්ති අරමුදලට (මාවරල වත්ත, හෙක්ටයාර 40.48) සහ කොන්ඩච්චි වතුයායට (හෙක්ටයාර 1,541) අයත් ඌන උපයෝජිත ඉඩම් ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය අනුගමනය කරමින් ආයෝජකයින්ට ලබා දීම අනුමත කරන ලදී. දෙවන අදියර යටතේ වන ඉඩම් පෙර පළමුවෙනි අදියර යටතේ බැහැර කිරීමට ඇතුළත් නොවේ.

## බලශක්ති

- **ශ්‍රී ලංකා විදුලිබල කර්මාන්තයේ මූලික පැවරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම** (2026 ජනවාරි 12)

  2024 අංක 36 දරන විදුලිබල (සංශෝධන) පනත යටතේ වන මූලික පැවරීමේ සැලැස්මට අනුව ලංකා විදුලිබල මණ්ඩලයෙන් අනුප්‍රාප්තික සමාගම් වෙත වත්කම්, වගකීම්, කාර්යයන් සහ කාර්ය භාරයන් පවරා දීම අනුමත අනරමත කරන ලදී. මෙය විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම ප්‍රතිව්‍යුහගත කිරීමට උපකාරී වේ.

## නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන

- **රජයේ ගොඩනැගිලි සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම** (2026 ජනවාරි 12)

  රජයේ ගොඩනැගිලිවල ඉංජිනේරු ඇස්තමේන්තු සඳහා නෛතික පදනමක් ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද පොදු ගොඩනැගිලි ගාස්තු උපලේඛනය අනුමත කරන ලදී. සියලුම මධ්‍යම රජයේ ආයතන අතර ඒකමතිකභාවයක් සහ වලංගුභාවයක් සහතික කිරීම මෙහි අරමුණ වේ.

- **ජාත්‍යන්තර ජල සංගමයේ 2026 ජල සුරක්ෂිතතා සමුළුව සඳහා සත්කාරකත්වය සැපයීම** (2026 ජනවාරි 12)

  ජල සුරක්ෂිතතාවය සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා 2026 මාර්තු 23 සිට 25 දක්වා රත්මලානේ පිහිටි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ විශිෂ්ඨතා කේන්ද්‍රයේ දී එම සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය පැවැත්වීම අනුමත කරන ලදී. ලෝක ජල දිනයට සමගාමීව, ජාත්‍යන්තර සහභාගීත්වය සහිතව පැවැත්වේ.

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන

- **රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීම** (2026 ජනවාරි 19)

  2016 ජනවාරි 1 වන දිනට පසුව බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා පවතින යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සහ වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඔවුන්ගේ දායක මුදල් ගෙවීම සහතික කිරීම සඳහා ඔවුන්ගේ පත්වීම් ලිපි සංශෝධනය කිරීම අනුමත කරන ලදී. 2016 වර්ෂයෙන් පසුව බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම පිළිබඳ පැහැදිලි භාවය සහ එය ක්‍රියාත්මක කිරීම සහතික කිරීම මෙහි අරමුණ වේ.

- **ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් / දිසාපති තනතුරට පත් කිරීම** (2026 ජනවාරි 19)

  වර්තමාන නිලධාරියා විශ්‍රාම ගැනීමෙන් පසු, 2026 ජනවාරි 26 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කේ. යූ. චන්ද්‍රලාල් මහතා ගාල්ල දිස්ත්‍රික් ලේකම් ලෙස පත් කිරීම අනුමත කරන ලදී. ඒ මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙක් වේ; මෙමගින් ප්‍රධාන පරිපාලන තනතුරක පුරප්පාඩුව පුරවනු ලැබේ.

- **රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් පිළිබඳ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම** (2026 ජනවාරි 12)

  අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් නිලධාරී කමිටුවේ නිර්දේශ අනුව, අමාත්‍යාංශ 20 ක් සඳහා සහ පළාත් සභා සහ සේවාවන් සඳහා ගුරුවරුන් 23,344 ක් ඇතුළුව සේවකයන්

26,095 දෙනෙකු බඳවා ගැනීම අනුමත කරන ලදී. සමාලෝචන කමිටුවකට අනුව ක්‍රමානුකූලව පුරප්පාඩු පුරවන බව මෙමගින් සහතික කරනු ලැබේ.

- **රජයේ නිලධාරීන් සඳහා උත්සව අත්තිකාරම් වැඩි කිරීම** (2026 ජනවාරි 12)

  චක්‍රලේඛ උපදෙස් නිකුත් කර, උත්සව සහ වන්දනා ගමන් සඳහා ලබා දෙනු ලබන අත්තිකාරම් මුදල රු. 10,000 සිට රු. 15,000 දක්වා වැඩි කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. රජයේ සේවකයින් සඳහා ප්‍රතිලාභ වැඩි කිරීම මෙහි අරමුණ වේ. වාරික 8 ක් මගින් මෙම මුදල ආපසු ගෙවිය හැකි ය.

## ජනාධිපති ලේකම් කාර්යාලය

- **රජයේ ආයතනවලට අයත් වාහනවලට ඉන්ධන සපයා ගැනීම සඳහා ඩිජිටල් කාඩ්පත් ක්‍රමවේදය හඳුන්වා දීම** (2026 ජනවාරි 12)

  ජනාධිපති ලේකම් කාර්යාලයේ සංචිත වාහන සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස ඩිජිටල් ඉන්ධන කාඩ්පත් ක්‍රමය හඳුන්වා දී, එහි සාර්ථකය මත අනෙකුත් ආයතන වෙත ව්‍යාප්ත කිරීම අනුමත කරන ලදී. විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ මාර්ගගත බැංකුකරණය ඒකාබද්ධ කිරීම වැඩි දියුණු කිරීම මෙහි අරමුණ වේ.

## මහජන ආරක්ෂක සහ ආරක්ෂක

- **පුද්ගලයන් ජාවාරම් කිරීමට එරෙහිව සටන් කිරීමේ සහ ජාවාරම් කිරීම වැළැක්වීමේ ජාතික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2026-2030** (2026 ජනවාරි 05)

  ආරක්ෂා කිරීම, නඩු කටයුතු මෙහෙයවීම (පැමිණිලි), හවුල්කාරිත්වය, පෙර තිබූ 2021-2025 සැලැස්ම පදනම් කරගැනීම යන ප්‍රවේශයන් හතර සහිත නව ජාතික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම අනුමත කරන ලදී. මෙය සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සසම්මුතියට සහ පැලමෝර් ප්‍රොටෝකෝලයේ බැඳීම්වලට අනුකූල වේ.

## පොලීසිය සහ සන්නද්ධ හමුදා සඳහා ප්‍රසම්පාදන සහ පහසුකම්

- **2026 වර්ෂයේ දී ත්‍රිවිධ හමුදාවන් සඳහා ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම** (2026 ජනවාරි 05)

  ජාතික තරගකාරී ලංසු කැඳවීම සහ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ නිර්දේශ පදනම් කර ගනිමින්, යුද හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව සඳහා අමු/වියළි සලාක සහ වෙනත් ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරුවන් වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම අනුමත කරන ලදී. මෙමගින් ලංසුකරුවන් 34 දෙනෙකුගෙන් යුද හමුදාව සඳහා ප්‍රසම්පාදන පැකේජ 1,219 ක්, නාවික හමුදාව සඳහා ප්‍රසම්පාදන පැකේජ 454 ක්, ගුවන් හමුදාව සඳහා ප්‍රසම්පාදන පැකේජ 242 ක් ආවරණය කරනු ලැබේ.

- **ශ්‍රී ලංකා පොලිසිය සඳහා නිවාස ඒකක 350 ක් මිලදී ගැනීම** (2026 ජනවාරි 05)

  'හාර්බර් වීව් රෙසිඩන්සීස්' නිවාස ව්‍යාපෘතියෙන් (කොළඹ 13 පිහිටි නිවාස ඒකක 452 ක් සහිත ව්‍යාපෘතියෙන්) පොලිස් නිලධාරීන් සඳහා නිවාස ඒකක 350 ක් මිලදී ගැනීම සහ වාහන නැවැත්වීමේ පහසුකම් ඉදිකිරීම අනුමත කරන ලදී. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල සේවය කරන පොලිස් නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම මෙහි අරමුණ වේ.

## තරුණ කටයුතු සහ ක්‍රීඩා

- **ක්‍රීඩා සංකීර්ණ සඳහා කළමනාකරණ මණ්ඩල පිහිටුවීම** (2026 ජනවාරි 05)

  ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ක්‍රීඩා සංකීර්ණවල භාවිතය, නඩත්තුව සහ පරිපාලනය වැඩිදියුණු කිරීම පිණිස 2025 - 2027 කාලය සඳහා සාමාජිකයින් 5 දෙනෙකුගෙන් යුත් කළමනාකරණ මණ්ඩල පිහිටුවීම අනුමත කරන ලදී. මෙය 'ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම' ව්‍යාපෘතියේ කොටසක් වේ; පාසල් ක්‍රීඩාංගන සහ පොදු ක්‍රීඩාංගන ද මෙයට ඇතුළත් වේ.

## IV. අති විශේෂ ගැසට් පත්‍ර (තෝරා ගත්)

### ජාතික ආරක්ෂාව සහ මහජන සාමය

ගැසට් අංක 2473/14 (2026 ජනවාරි 28) - මහජන ආරක්ෂක ආඥා පනත

- රජයට මහජන සාමය සුරක්ෂිත කිරීමට සහ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට හැකි වනු පිණිස ජනාධිපතිවරයා විසින් රට පුරා මහජන හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

ගැසට් අංක 2473/13 (2026 ජනවාරි 28) - අත්‍යාවශ්‍ය මහජන සේවා පනත

- විදුලිය, ඉන්ධන, රෝහල්, ප්‍රවාහනය, ජලය, ආහාර, පළාත් පාලන ආයතන, වාරිමාර්ග, විදුලි සංදේශ සහ කෘෂිකර්මාන්ත යන සේවා ආවරණය වන පරිදි, දිට්වා සුළි කුණාටුවෙන් පසු යථා තත්ත්වයට පත්කිරීමේ මෙහෙයුම් අත්‍යවශ්‍ය සේවාවන් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

ගැසට් අංක 2473/16 (2026 ජනවාරි 28) - 2026 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග

- බලධාරීන් පත් කිරීම, පරිශ්‍ර, වාහන සහ සේවා අධිග්‍රහණයට ගැනීම, අත්‍යවශ්‍ය සේවා ප්‍රකාශයට පත්කිරීම, අවහිර කිරීම් හෝ වැරදි තොරතුරු වැළැක්වීම, බලතල පැවරීම, නිලධාරීන් ආරක්ෂා කිරීම සහ දඬුවම් කිරීම ඇතුළු හදිසි අවස්ථා බලතල ස්ථාපනය කර, 2025 හදිසි අවස්ථා නියෝග අවලංගු කරන ලදී.

ගැසට් අංක 2473/8 (2026 ජනවාරි 26) - ජනාධිපතිවරයාගේ නියමය

- නිශ්චිතව දක්වා ඇති දිස්ත්‍රික්කවල සහ යාබද ජල තීරවල මහජන සාමය පවත්වා ගැනීම සඳහා 2026 ජනවාරි 07 වෙනි දින සිට සන්නද්ධ හමුදාවන්හි සියලුම සාමාජිකයන් කැඳවන ලදී.

ගැසට් අංක 2470/56 (2026 ජනවාරි 09) - මහජන ආරක්ෂක ආඥා පනත

- 2025 දෙසැම්බර් 28 වෙනි දින සිට ශ්‍රී ලංකාව පුරා ආඥා පනතේ II කොටස ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශනයට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දීම දැනුම් දෙන ලදී.

### ලියාපදිංචි කිරීම සහ අනන්‍යතා

ගැසට් අංක 2472/47 (2026 ජනවාරි 22) - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත

- යටිතල පහසුකම් සහ තාක්ෂණික කාර්ය පටිපාටි සූදානම් වන තෙක්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ ඇතැම් විධිවිධාන/නියෝග සඳහා ක්‍රියාත්මක වීම කල් ඉකුත් වීමේ දිනය 2026 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී.

ගැසට් අංක 2472/22 (2026 ජනවාරි 21) - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත

- අවශ්‍ය කාර්ය පටිපාටි සකස් කරන තෙක් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ ඇතැම් විධිවිධානවල/නියෝගවල කල් ඉකුත් වීමේ දිනය 2026 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කිරීම නැවත අවධාරණය කරන ලදී.

### මැතිවරණ

ගැසට් අංක 2472/21 (2026 ජනවාරි 21) - පාර්ලිමේන්තු මැතිවරණ පනත

- පක්ෂවල ව්‍යවස්ථාව, නිලධාරී ලැයිස්තු, විගණනය කරන ලද ගිණුම්, ප්‍රතිපත්ති ප්‍රකාශන සහ අඛණ්ඩ දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳ සාක්ෂි ඇතුළුව පාර්ලිමේන්තු මැතිවරණ සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීම සඳහා නිර්ණායක නියම කරන ලදී. අභ්‍යන්තර පාලනය, ස්ත්‍රී-පුරුෂ සමාජභාව නියෝජනය, මූල්‍ය විනිවිදභාවය සහ පක්ෂ තුළ ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීම සඳහා වන මාර්ගෝපදේශ සපයා දෙයි.

ගැසට් අංක 2471/24 (2026 ජනවාරි 13) - පාර්ලිමේන්තු මැතිවරණ පනත

- පාර්ලිමේන්තු මැතිවරණ කාර්යයන් සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල ලකුණු අනුමත කරන ලදී.

අංක 2470/48 (2026 ජනවාරි 08) - පාර්ලිමේන්තු මැතිවරණ පනත

- පාර්ලිමේන්තු මැතිවරණ කාර්යයන් සඳහා පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුව ප්‍රකාශයට පත් කරන ලදී.

## කම්කරු සහ රැකියා

ගැසට් අංක 2473/25 (2026 ජනවාරි 30) - සාප්පු සහ කාර්යාල සේවකයන් පිළිබඳ පනත

- රාත්‍රී මුර රාජකාරි, සුභසාධන වගකීම්, නවාතැන් සහ ප්‍රවාහන විධිවිධාන නිශ්චිතව දක්වමින්, කාන්තා සාප්පු/කාර්යාල සේවිකාවන් පිළිබඳ 1954 වර්ෂයේ නියෝග සංශෝධනය කරන ලදී.

ගැසට් අංක 2472/69 (2026 ජනවාරි 24) - පඩි පාලක සභා ආඥා පනත

- 2025 ඔක්තෝබර් මාසය සඳහා වන ජීවන වියදම් දර්ශකය (212.2) මත පදනම්ව, 2025 නොවැම්බර් සඳහා කොකෝවා, එනසාල් සහ ගම්මිරිස් වගා කිරීමේ සහ නිෂ්පාදන වෙළඳාමේ නියුතු දෛනික වැටුප් ලබන කම්කරුවන් සඳහා විශේෂ දීමනාව නිශ්චිතව දක්වන ලදී. ඒ අන්ව ගෙවන මුදල: සාමාන්‍ය වැඩ කරන දිනකට සේවකයෙකුට රු. 1,852.39.

## ප්‍රවාහන සහ රථ වාහන

ගැසට් අංක 2471/68 (2026 ජනවාරි 17) - ජාතික ප්‍රවාහන කොමිෂන් සභා පනත

- පැවරුම්කරුවන් සහ පැවරුම්ලාභීන් සඳහා වන මූල්‍ය හා මෙහෙයුම් නියමයන් ඇතුළුව මගී සේවා බලපත්‍ර පවරා දීම, අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නැවත අලුත් කිරීම සඳහා වන කාර්ය පටිපාටි ස්ථාපනය කරන ලදී.

ගැසට් අංක 2470/14 (2026 ජනවාරි 05) - මෝටර් වාහන පනත

- හතරවන උපලේඛනයේ ගාස්තු සංශෝධනය කිරීම: මෝටර් සයිකල්/මෝටර් ට්‍රයිසිකල් හැර අනෙකුත් සියලුම වාහන සඳහා විශේෂ වාහන අංක (100,000 දක්වා ඉදිරියට යන අංකයක්) වෙන් කිරීම; ගාස්තුව රු. 1,000,000 ලෙස නියම කර ඇත.

## සත්ව සෞඛ්‍යය

ගැසට් අංක 2471/33 (2026 ජනවාරි 13) - සත්ත්ව රෝග පනත

- සියලුම දිස්ත්‍රික්ක අප්‍රිකානු සූකර උණ සඳහා අවදානම් ප්‍රදේශයක් ලෙස ද, ඌරන් රෝග අවදානම් සතුන් ලෙස ද, විශේෂයෙන් නියම කිරීම කරන ලදී. අවසර පත්‍ර නොමැතිව ඌරන්/ඌරු මස් ප්‍රවාහනය කිරීම, විකිණීම, ඝාතනය කිරීම සහ සැකසීම තහනම් කිරීමට, සහ මාස තුනක කාලයක් සඳහා මෙම පියවර ක්‍රියාත්මක කිරීමට නිලධාරීන්ට බලය පවරයි.

## ක්‍රීඩා සහ තහනම් උත්තේජක විරෝධී

ගැසට් අංක 2471/51 (2026 ජනවාරි 16) - ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුතිය පනත

- ලෝක තහනම් උත්තේජක ද්‍රව්‍යයන් පිළිබඳ නීති සංග්‍රහයට අනුකූලව, 2026 ජනවාරි 1 සිට බලපැවැත්වෙන පරිදි, ක්‍රීඩාවලදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිළිබඳ 2026 තහනම් ලැයිස්තුව ප්‍රකාශයට පත් කරන ලදී.

## ආගම් ඇදහීම

ගැසට් අංක 2472/51 (2026 ජනවාරි 23) - වන්දනා ගමන් ආඥා පනත

- දකුණු පළාතේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හිනිදුම දකුණ සහ මල්හතාව ග්‍රාම නිලධාරී කොට්ඨාශ දෙකට අයත් හිනිදුම කල්වාරි සිද්ධස්ථානයේ (ශාන්ත ආනා දේවස්ථානය) වාර්ෂිකව

පවත්වනු ලබන චතාරික වන්දනා සමය පිළිබඳ දැනුම් දීම. වන්දනා කාලය 2026 පෙබරවාරි 18 වෙනි දින සිට 2026 අප්‍රේල් 5 වෙනි දින දක්වා පැවැත්වීමට නියම කර ඇත.

## පත්කිරීම්

ගැසට් අංක 2472/45 (2026 ජනවාරි 22) - ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත්කිරීම්

- වෛද්‍ය අනිල් ජයසිංහ මහතා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ලෙස 2026 ජනවාරි 15 වෙනි දින සිට වසරක කාලයක් සඳහා පත් කරන ලදී.

ගැසට් අංක 2470/23 (2026 ජනවාරි 07) - පළාත් සභා පනත

- 2025 දෙසැම්බර් 19 දින සිට බලපැවැත්වෙන පරිදි දකුණු පළාතේ ප්‍රධාන ලේකම් ලෙස චන්දිම සී. මුහන්දිරම්ගේ මහතා පත් කරන ලදී.

## ජාත්‍යන්තර සහයෝගීතාවය

ගැසට් අංක 2470/4 (2026 ජනවාරි 05) - සාපරාධී කාරණා වලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ පනත

- ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම නිරීක්ෂණය කිරීම/තහනම් කිරීම ඇතුළුව මාලදිවයින සමග අපරාධ කටයුතු සඳහා සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය නෛතික සහාය සඳහා පනතේ විධිවිධාන අදාළ කිරීම.

## ත්‍රස්තවිරෝධී සහ සම්බාධක

ගැසට් අංක 2470/19 (2026 ජනවාරි 06) - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝග

- නම් කරන ලද ත්‍රස්තවාදී ආයතන සහ පුද්ගලයින්ගේ සංශෝධිත ලැයිස්තුව: එල්.ටී.ටී.ඊ., ටී.ජී.ටී.ඊ., එන්.ටී.ජේ., ටී.සී.සී., ඩබ්.ටී.එම්. සහ ඒ ආශ්‍රිත පුද්ගලයින් පිළිබඳ සම්බාධක, අධීක්ෂණය සහ අරමුදල් සීමා කිරීම් සඳහා.

ගැසට් අංක 2470/20 (2026 ජනවාරි 06) - එක්සත් ජාතීන්ගේ පනත

- 4 වෙනි නියෝගය (එක්සත් ජාතීන්ගේ සම්බාධක) යටතේ නම් කරන ලද පුද්ගලයින්, කණ්ඩායම් සහ ආයතනවල සියලු ම අරමුදල්, මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් ක්‍රියා විරහිත කරන ලදී. පෙර නියෝග ඒ යටතේ සිදුකරන ලද කිසිදු ක්‍රියාවකට අගතියක් නොවන පරිදි අවලංගු කරන ලදී.

## දූෂණ විරෝධී

ගැසට් අංක 2470/18 (2026 ජනවාරි 05) - දූෂණ විරෝධී පනත

- 26(4), (5), (8) සහ (9) වෙනි වගන්ති යටතේ කොමිෂන් සභාවට තාවකාලිකව පත් කරන ලද නිලධාරීන්/සේවකයින් සඳහා නීති; 2026 ජනවාරි 01 සිට බලපැවැත්වේ; ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ පනතට අනනුකූල නොවන අදාළ රජයේ නීති ක්‍රියාත්මක කිරීම සහතික කරන ලදී.

## සමිති ලියාපදිංචි කිරීම

ගැසට් අංක 2470/30 (2026 ජනවාරි 07) - සමිති ආඥාපනත

පහත සඳහන් සමිති ඇතුළු බහුවිධ සමිති ලියාපදිංචි කරන ලදී:

- සූර්යෝදා සංවිධාන එකමුතුව: සමාජය ශක්තිමත් කිරීම, සමාජ ව්‍යවසායකත්වයට සහාය වීම, ස්වේච්ඡා සංවිධාන එක්සත් කිරීම, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම, ජනතාව සංවිධානය කිරීම
- සොසයිටි ඔෆ් ඉන්ජිනියරිං සර්විසස් ඔෆිසර්ස් ලිමිටඩ් (සීමාසහිත ඉංජිනේරු සේවා නිලධාරීන්ගේ සංගමය): ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)-5/6 ඉංජිනේරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, වෘත්තීය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම, රැකියා සඳහා සහාය වීම, නීතිමය සහාය ලබා දීම, සහ

විෂයමාලා සංවර්ධනය යෝජනා කිරීම.

- මෙට්ෂු නැචුරල් ෆාමර්ස් ඇසෝසියේෂන්: පොල් ගොවීන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීම, සාධාරණ මිල ගණන් සහතික කිරීම, පොල් හිගය අඩු කිරීම